## මතකයේ තබා ගත යුතු වැදගත් කරුණු කිහිපයක්

- රක්ෂණ ඔප්පුව මිල දී ගැනීමට පෙර, රක්ෂණ සමාගම හෝ රක්ෂණ උපදේශකවරයා විසින් දෙනු ලබන සියලු තොරතුරු හොඳින් කියවා තේරුම් ගන්න. යෝජනා පත්‍රය සහ අනිකුත් අදාල ප්‍රකාශන මත අත්සන තැබීමට පෙර ඒවා ඉතා ප්‍රවේශමෙන් කියවා බැලිය යුතු වේ.
- ආයෝජන සම්බන්ධිත අරමුදල් වල අතීත කාර්ය සාධනය, ඒවායේ අනාගත කාර්යසාධනය පිළිබඳ සහතිකයක් නොවන අතර, ආයෝජනය කිරීමට අරමුදලක් තෝරා ගැනීම සඳහා උපකාරයක් ලෙස පමණක් එම තොරතුරු පාවිච්චි කළ යුතු වේ.
- ආයෝජන සම්බන්ධිත රක්ෂණයක ඔබගේ මුදල් ආයෝජනය කිරීමේ දී, අදාල අවදානම් පිළිබඳ කල්පනා කළ යුතු වන අතර එම අවදානම් පිළිබඳව ඔබට නිසි අවබෝධයක් තිබෙන බවට තහවුරු කරගන්න.
- ආයෝජන සම්බන්ධිත රක්ෂණයක ආයෝජනය කිරීමේ අවදානම් හා ප්‍රතිලාභ පිළිබඳ විස්තර, ඔබගේ රක්ෂණ සමාගමෙන් හෝ රක්ෂණ උපදේශකවරයාගෙන් ලබාගත හැකිය.
- රක්ෂණ ඔප්පුව දිගටම පවත්වාගෙන යන්නේ ද නැතහොත් එය අවලංගු කරන්නේ ද යන්න තීරණය කිරීම සඳහා, ඔප්පුව ඔබ වෙත ලැබීමෙන් පසු දින 21 ක කාලයක් ඔබට හිමි වේ. යම් හෙයකින් රක්ෂණ ඔප්පුව අවලංගු කරන්නේ නම්, එම තීරණය අදාල කාලසීමාව තුලදී රක්ෂණ සමාගමට දැනුම් දුන් විට (රක්ෂණ සමාගම විසින් දරනු ලැබූ මූලික වියදම් අඩු කර ගැනීමෙන් පසු), ඔබගෙන් අයකරගත් මුදල් නැවත ඔබ වෙත ලබාදීමට රක්ෂණ සමාගම කටයුතු කරනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අමතන්න -

**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා ඒකකය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකතන අංකය : 011 2396184-9
ෆැක්ස් : 011 2396190

INSURANCE
REGULATORY
COMMISSION OF
SRI LANKA

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, රක්ෂණ ඔප්පුහිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

# ආයෝජන සම්බන්ධිත (Investment Linked) රක්ෂණ ඔප්පු



INSURANCE
REGULATORY
COMMISSION OF
SRI LANKA

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**මෙය, ආයෝජන සම්බන්ධිත රක්ෂණ සැලසුම් හඳුනා ගැනීම සඳහා උපකාරී වන මූලික මාර්ගෝපදේශයකි. ආයෝජන සම්බන්ධිත රක්ෂණ සැලැස්මක් ලබා ගැනීමේ දී සලකා බැලිය යුතු මූලික කරුණු පිළිබඳව මෙමගින් ඔබට දැන ගත හැක.**

## ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පුවක් යනු කුමක් ද?

- මෙය ආරක්ෂණය හා ආයෝජන ප්‍රතිලාභ එකවර ලබාදෙන ජීවිත රක්ෂණ ඔප්පුවකි.
- මේ සඳහා වාරිකයෙන් කොටසක් ජීවිත රක්ෂණාවරණය සඳහා යෙදවෙන අතර අනෙක් කොටස ඔබ විසින් තෝරා ගනු ලබන විශේෂිත ආයෝජන අරමුදල්වල ආයෝජනය කරනු ලැබේ.
- මෙම රක්ෂණාවරණය යටතේ අනිවාර්යයෙන්ම මරණ ප්‍රතිලාභයක් හිමි වන අතර, ඔබගේ තෝරා ගැනීම මත සමාගම විසින් ලබාදෙන අතිරේක ආවරණයන් ද ඊට ඇතුළත් කර ගැනීම සඳහා හැකියාව ඇත.

## ඔබගේ මුදල් ආයෝජන කළ හැක්කේ කෙසේද?

- ඔබ බාර ගැනීමට කැමති අවදානම් මට්ටම අනුව, විවිධ ආයෝජන අරමුදල් අතරින් සුදුසු අරමුදලක් / අරමුදල් ඔබට තෝරා ගත හැක.
- ආයෝජන අරමුදල් සමාන වටිනාකම් වලින් යුත් ඒකක වලට බෙදා ඇති අතර, එම ඒකකයන්හි මිල ගණන්, අරමුදලේ ආයෝජනවල ක්‍රියාකාරිත්වය අනුව තීරණය වේ.
- ආයෝජන අරමුදල් කළමනාකරණය රක්ෂණ සමාගම් විසින් කරනු ලබන අතර, ඔබගේ රක්ෂණ සමාගම ඇමතීමෙන් ආයෝජනවල වත්මන් වටිනාකම හා ඒකක මිල දැනගත හැකිය. ඊට අමතරව, අදාල කාලය තුළ සිදුවූ සියලු ගනුදෙනු හා අයකිරීම් ද ඇතුළුව ඔබගේ අයෝජනවල තත්වය පිළිබඳව වාර්ෂික වාර්තාවක් ද, රක්ෂණ සමාගම විසින් ඔබට ලබා දෙනු ලැබේ.
- කොටස් වෙළඳපොළේ මුදල් ආයෝජනය කෙරෙන ආයෝජන අරමුදලක ආයෝජනයක් කිරීමෙන් ඔබට වැඩි ප්‍රතිලාභ ලබාගත හැකිය. එහෙත්, වැඩි ප්‍රතිලාභ ලැබෙන ආයෝජනවල වැඩි අවදානමක් ද තිබෙන බව මතක තබාගත යුතුය.

## මෙහි ඇති අවදානම කුමක් ද?

- වෙනත් ඕනෑම ආයෝජනයකදී මෙන්ම, ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පුවල ආයෝජනය කිරීමේදී ද, ආයෝජන ප්‍රතිලාභයන්ට අදාල අවදානමට ඔබට මුහුණ දීමට සිදුවේ.
- ඔබගේ ආයෝජනයේ වටිනාකම, අදාල ආයෝජන අරමුදලේ ඒකක මිල හා බැඳී පවතින බැවින්, ඒකක මිලෙහි වෙනස්වීම් වලට අනුව ඔබගේ ආයෝජන අරමුදලේ වටිනාකම අඩු වැඩි විය හැක.
- ඒකක මිල පහත වැටෙන විට, ඔබගේ ආයෝජනවල වටිනාකමත් පහත වැටෙන අතර, ඒකක මිල ඉහළ යන විට ඔබගේ ආයෝජනවල වටිනාකම ද ඉහළ යනු ඇත. රක්ෂණ ඔප්පුව කල්පිරීමේදී හෝ ඔබගේ ඒකක මුදල් කිරීමේ දී, ඒ අනුව ඔබට ලාභයක් හෝ අලාභයක් සිදුවිය හැක.
- විශේෂයෙන්ම, ඔබ ආයෝජනය කළ මුදලට වඩා අඩු මුදලක් ආපසු ලැබීමේ අවදානමක් ඇත.
- ආයෝජන ප්‍රතිලාභ වල අවදානම මුළුමනින්ම ඔප්පුහිමියා විසින් දරාගත යුතු වන අතර, රක්ෂණ සමාගම වගකියනු ලබන්නේ ඔප්පුවේ සඳහන් රක්ෂණ ප්‍රතිලාභ සඳහා පමණි.

## ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පුවක් මිල දී ගැනීමේ දී ඔබ විසින් සලකා බැලිය යුතු කරුණු

- ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පුවක් මිල දී ගැනීමට තීරණය කිරීමෙන් පසු, ආයෝජනය කරනු ලබන මුදල, එම මුදල් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන අරමුදල, අවශ්‍ය කරන ජීවිත ආවරණය (මරණ ප්‍රතිලාභය) සහ වාරික ගෙවනු ලබන කාල සීමාව යනාදී කරුණු පිළිබඳව ඔබ සලකා බැලිය යුතුය.
- ඔබගේ ආයෝජන මුදලින් සමාගම් විසින් අය කර ගනු ලබන; ඒකක වෙන් කිරීමේ ගාස්තු, අරමුදල් කළමනාකරණ ගාස්තු, පරිපාලන ගාස්තු, මර්ත්‍යතා ගාස්තු, අරමුදල් අතර මුදල් මාරු කිරීමේ ගාස්තු හා පවාරණ ගාස්තු යනාදී විවිධ ගාස්තු සම්බන්ධයෙන් ඔබ දැනුවත් විය යුතුය. මෙම ගාස්තු ලෙස අය කරන මුදල, ගාස්තු අය කිරීමේ පදනම හා ගාස්තු අය කෙරෙන වාර ගණන යනාදිය පිළිබඳ, ඔබගේ රක්ෂණ උපදේශකවරයාගෙන් හෝ රක්ෂණ සමාගමෙන් පැහැදිලි කිරීම් ලබාගත හැකිය.
- සමහර රක්ෂණ ඔප්පු, මුල් අවුරුදු 03 ක කාලය තුළ කිසිදු මූල්‍ය අගයක් අත් කර නොගනී. එබැවින්, එම කාලය තුළ රක්ෂණ ඔප්පුව පවාරණය කළහොත් ඔබට කිසිදු මුදලක් හිමි නොවනු ඇත.
- ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල තෝරා ගැනීමට, ආරම්භයේදී ඔබට අවස්ථාවක් හිමි වේ. ස්ථාවර ආදායම් සහිත අරමුදල් ලෙස සලකන, රජයේ බැඳුම්කර හෝ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට වඩා කොටස් වෙළඳපොළෙහි ආයෝජනය කිරීම අවදානම් සහගත වේ. ඔබගේ කැමැත්ත පරිදි, සියලු මුදල් එක අරමුදලක හෝ තෝරාගත් අරමුදල් සමූහයක ආයෝජනය කිරීමට ද හැකියාව ඇත.
- ඔබගේ ආයෝජන අරමුදල් වෙනස් කිරීමට අවශ්‍ය විටක දී, එක් ආයෝජන අරමුදලකින් තවත් එකකට ඔබගේ ඒකක (මුදල්) මාරු කිරීමට ඔබට අවස්ථාව තිබේ. බොහෝ සමාගම් වසරකට එක් වරක් මෙම අවස්ථාව නොමිලයේ ලබා දේ.
- ඔබගේ ගෙවීමේ හැකියාව මත රක්ෂණ සැලැස්මේ වාරික මුදල ඉතා සැලකිල්ලෙන් තීරණය කරන්න. කල්පිරීමට පෙර ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පුවක් පවාරණය කළහොත්, එහි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබට නොහැකි වේ.